**මිහින්තලය ප්‍රාදේශීය සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මිහින්තලය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මිහින්තලය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ). 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාරව අස්ථිත්වයක් පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු එම කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළයුතු වුවත් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අයවැයගත තොරතුරු රහිතව ඉදිරිපත් කර තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අයවැයගත තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | පළාත් පාලන ආයකන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. |
| (ආ) | ප්‍රමිතිය මගින් හඳුන්වා දෙන ලද ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ ආකෘතියට අනුකූල නොවන ලෙස ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කර තිබුණි. | පිළිගනිමි. | පළාත් පාලන ආයකන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ විගණන ගාස්තු බිල්පත රු.131,100 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එය රු.300,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වගකීම් රු.168,900 ක් වැඩියෙන් දැක්වුණි. | පිළිගනිමි. | නිවැරදි විගණන ගාස්තුව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වියදම් තුළ 2017 සහ 2020 (රු.300,000) වර්ෂවලට අදාළව ගෙවිය යුතු රු.426,794 ක් ඇතුළත් වී තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමෙන් අඩුවී තිබුණි. | | වර්ෂයට අදාළ විගණන ගාස්තුව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ යටතේ දේපළ පිරියත උපකරණ මිලට ගැනීම් ලෙස මුදලින් සිදු නොවුණු රු.22,525,439 ක්ද ඇතුළත් වී තිබුණි. | | මුදලින් සිදුවන ගනුදෙනු පමණක් මුදල් ප්‍රවාහය තුළ දැක්විය යුතුවේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ ගෙවිය යුතු වියදම් රු.263,433 ක් 2022 වර්ෂයේදී ගෙවා තිබුණු නමුත් එම වියදම උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබුණි. | | උපචිත පදනම මත වියදම් ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වටිනාකම රු.2,684,770 ක් වූ ණයහිමියන් සහ ණයගැතියන් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ සටහන් 13 සහ 17 යටතේ දක්වා නොතිබුණි. | පිළිගනිමි. | සමාලෝචිත වර්ෂයට අදාළ ණයහිමි සහ ණයගැති වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළ යුතුවේ. |
| (ඊ) | ප්‍රාදේශීය සභාවේ බැකෝ ලෝඩර් යන්ත්‍රය සහ ගලි බවුසරය කුලියට ලබාදීමට වෙනුවෙන් ලැබිය යුතු රු.39,200 ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | | සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ආදායම් මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ මාර්ග පාලම් හා බෝක්කු වලට එකතුකිරීම් ලෙස මාර්ග දෙකක බොරළු දැමීමේ වියදම් රු.873,037 ක් ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් එම වටිනාකමෙන් වැඩිවී තිබුණි. | | බොරළු මාර්ග ඉදිකිරීම ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත නොකළ යුතුවේ. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 08 ක ඉන්ධන දහන පරීක්ෂා කර නොතිබුණි. | පිළිගනිමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අයභාරය රු.8,740,711 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අයභාරය රු.6,249,599 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය බැංකු ජංගම ගිණුමක රු.1,000,000 ක් ඉක්මවූ මුදලක් අඛණ්ඩව වර්ෂයකට වඩා වැඩි කාලයක් රඳවා ගෙන තිබුණි. | හදිසි අවශ්‍යතාවයක් සඳහා යොදවා ගත යුතු බැවින් ජංගම ගිණුම්වල රඳවා තබාගෙන ඇත. | අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් ලබාගැනීමට ක්‍රියාකළ යුතුවේ. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු අයකර ගැනීම සඳහා ක්‍රියා කරමින් පවතී. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |
| (ii) | 2019 වර්ෂයේ සිට අයවිය යුතු රු.101,844 ක්වූ කසළ බදු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | හිඟ කසළ බදු අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | කුලී | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,640,712 ක හිඟ කඩ කුලී අයවී නොතිබුණි. | තැන්පත් මුදලින් හිලව්කර ගැනීමට කටයුතු කර ඇත. | හිඟ කුලී අයකර ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | ප්‍රාදේශීය සභාව විසින් ගිවිසුම්ගතව වෙළඳ අයිතිය බදුදී ඇති A,B,C,D ලෙස සඳහන් වෙළඳ සංකිර්ණයේ හා පොදු වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමර 68 ක් සඳහා කුලී නැවත තක්සේරු නොකර 2009 වර්ෂයේ සිදුකරන ලද තක්සේරුව අනුව කුලී අයකර ගැනීම සිදුකරමින් පැවතුණි. | විවිධ දේශපාලන හේතු මත 2009 තක්සේරුව මත කුලී අයවෙමින් පවතී. | නව තක්සේරුවකට අනුව කුලී අයකරගත යුතුවේ. |
| (iii) | 2019 වර්ෂයේ සිට පැවත එන රු.379,260 ක් වූ හිඟ ටෙන්ඩර් කුලී (මස්කඩ) අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද අපොහසත් වී තිබුණි. | ප්‍රාදේශීය ලේකම්ගේ සහ මහ ජනතාවගේ ඉල්ලීම අනුව මස් කඩය වැසීම නිසා හිඟ කුලී ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත. | ගිවිසුමට අනුව හිඟ කුලී අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |
| (ඇ) | වෙනත් ආදායම්<br>-----------------<br><br>2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.577,482 ක හිඟ දැන්වීම් පුවරු ආදායම් අයකරගෙන නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | අයකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා වෙළඳ සංකිර්ණයේ බිම් මහලේ පිහිටි කඩ කාමරයක් සඳහා 2020 වර්ෂයට ලැබිය යුතු රු.151,500 ක කුලී අයනොකර කපාහැරීම සඳහා කටයුතු කර ඇතත් ඒ සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කරුණු පරීක්ෂාකර බලා නැවත සහන ලබාගැනීමට මහ සභාව වෙත ඉදිරිපත් කර අදාළ විෂයභාර අමාත්‍යාංශය හෝ ආණ්ඩුකාරවරයා වෙත යැවීමට කටයුතු කරමි. | ප්‍රාදේශීය සභා පනතේ සඳහන් පරිදි ක්‍රියාකළ යුතුවේ. |